# සංහාරයේ දෝංකාරය

Resonance of the Massacre 1818 - 2018

# සංහාරයේ දෝංකාරය යනු...

සංහාරයේ දෝංකාරය යනු යුරෝපීය දේශපාලනික න්‍යාය පත්‍ර උදෙසා ක්‍රියාත්මක වූ යටත් විජිතවාදී මෙහෙයුම් අතරතුර අතිශය කෲර ලෙස මරා දැමූ දහස් සංඛ්‍යාත සිංහලයින්ගේ විලාපයේ අනවරත දෝංකාරයයි. ව්‍යවහාර වර්ෂ 1505 සිට 1948 ප්‍රත්‍යාත් යටත් විජිත තත්ත්වය ලබාදෙන තුරු පෘතුගීසි, ලන්දේසි හා අවසාන වශයෙන් ඉංග්‍රීසි යනුවෙන් කෲරත්වයේ අවධි හා ස්වරූප ත්‍රිත්වයක් ස්වදේශික බහුතර සිංහලයන්ද, දෙමළ හා මුස්ලිම් ජනතාවද අත්වින්දාහ.

# ඒ ගලාගිය උණු ලේ සුවඳ තවමත් දැනේ..

ඒ විලාපයන් තවමත් ඇසේ. ලොව පුරා කතා බහට ලක්ව ඇති මහා මිනිස් ඝාතන අතුරින් එකක් වූ 1818 සංහාරය අප ස්මරණය කළ යුත්තේ නූතන පෘතුගාලය හෝ ඕලන්දය හෝ එංගලන්තය සමග වෛරී සිතුවිලි ජනනයට නොව, ඓතිහාසික වශයෙන් අපට සිදුවූ දැවැන්ත අසාධාරණය සිහිපත් කිරීමටය; ඒ අඳුරු යුගයන්හිදී, යටත් විජිතවාදීන් විසින් සිංහලයන් සංහාරයට සුළුතර දෙමළ හා මුස්ලිම් ජාතිකයින් පමණක් නොව වරදානයන්ට ගිජු සිංහලයන් පවා යොදාගත් බව මෙනෙහි කිරීමටය; යටත් විජිත පාලනයේ අවසන් වකාවානුවේ උපක්‍රමශීලීව ක්‍රියාත්මක කළා වූ දේශපාලන උපාය තවමත් කරපින්නා ගෙන සිටින අපි එකිනෙකා සමග කා කොටා ගන්නා බව ඒත්තු ගැන්වීමටය.!

# එළඹෙන 2018 වසරේදී ඒ සංහාරයට දෙසියය වසරක් සපිරෙන්නේය.

ඒ සඳහා..1505 සිටම ඇරඹී අඳුරු යුගයේදී බහුතර සිංහලයන්ද, ස්වදේශික දෙමළ හා මුස්ලිම් ජාතිකයන්ද අත්විඳි අති අමානුෂික අයුක්ති සහගත අත්දැකීම් 20ක් විශාල කැන්වස් පුවරු මත සිත්තම් වී තිබේ. ඒ ප්‍රවීන සිත්තරුන් දෙපළකගේ තෙලි තුඩිනි. දේශප්‍රේමීන් හා ආයතන ගණනාවක අනුසරණින් එය සංවිධානය කෙරේ.











# 2017 නොවැම්බර් 25, 26 හා 27

තෙදින තුළ මේ අපූරු සිත්තම් පෙළහර
කොළඹ, තුම්මුල්ල ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේදී
පැවැත්වීමට “සිංහල සංගේදම” කටයුතු කරයි.

කොළඹ ප්‍රදර්ශනයෙන් අනතුරුව දිවයිනේ වෙනත් ප්‍රදේශ
වලද “සංහාරයේ දෝංකාරය” සැරිසරනු ඇත.

**ප්‍රදර්ශනය සඳහා විදේශීය තානාපතිවරුන්, රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්, රාජ්‍ය නායකයින්, දේශපාලනඥයින්, විද්වතුන්, පර්යේෂකයින්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට ආරාධනා කරනු ඇත.**